# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.


අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2009 දිනය / திகதி / Date 2009- 12- 23

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 21/ 2009**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්.

## රාජ්‍ය සේවා, පළාත් රාජ්‍ය සේවා සේවකයින් සඳහා වූ දායක විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කිරීම හා අයකළ දායක මුදල් රඳවා ගැනීම

2003- 01- 01 දින සිට ක්‍රියාත්මක වූ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය 2006- 12- 31 දින සිට අහෝසි කිරීමට කටයුතු කරන ලදී. මහාභාණ්ඩාගාරයේ කළමනාකරණසේවා චක්‍රලේඛ අංක 18 සහ 18 (1) විධිවිධාන අනුව මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දායකයාගෙන් අයකළ 8% ක මුදලත් රාජ්‍ය ආයතනයේ දායකත්වය වූ 12% ක මුදලත් ශ්‍රී ලංකා මහ බැංකුවේ දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලක තැන්පත් කළ යුතුව තිබුණි.

එසේ නොකොට තව දුරටත් ඔබ ආයතනයේ විවිධ තැන්පත් ගිණුම්හි රඳවාගෙන ඇති දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා අයකළ දායක මුදල් සම්බන්ධයෙන් 2010- 06- 30 දිනට ප්‍රථම පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතු බව කාරුණිකව දන්වා සිටිම.

1. සියළුම මධ්‍යම රජයේ ආයතන විසින් තව දුරටත් රඳවාගෙන ඇති මෙම මුදල් හරස් සටහන් මඟින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතුය.

2. සියළුම පළාත් පාලන හා පළාත් සභා ආයතන මඟින් තව දුරටත් රඳවාගෙන ඇති දායකත්ව විශ්‍රාම වැටුප් සඳහා අයකළ දායක මුදල් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ ගිණුම්ගත කිරීම සඳහා චෙක්පත් මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

2010- 06- 30 දිනට ප්‍රථම ඉහත සඳහන් පරිදි කටයුතු නොකරනු ලබන ආයතන ප්‍රධානීන් විසින් එසේ තවදුරටත් රඳවාගෙන ඇති මෙම මුදල් සම්බන්ධයෙන් පෞද්ගලිකව වගකිවයුතු බවද දන්වා සිටිමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් - දැ.ගැ.ස.
02. විගණකාධිපති - දැ.ගැ.ස.


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone | |
|---|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 | |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 | |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 | E-mail: pensions@sltnet.lk |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 | Web site: www.pensions.gov.lk |